# සිංහල භාෂාවෙහි ඇ'වර්ණයේ ප්‍රභවය, විකාසය, සහ භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

කේ. කේ. පී. පෙරේරා[1]

සිංහල භාෂාව මුල් යුගයේ දී මාතෘ භාෂාවල දැඩි බලපෑමට ලක්වුවත් එහි ස්වාධීනත්වය හඳුනාගත හැකි අවස්ථාවක් ලෙස සිංහල භාෂාව කෙරෙහි ඇ'වර්ණයේ බලපෑම දැක්විය හැකි ය. බොහෝ විට ඇ'වර්ණයේ ප්‍රභවය සම්බන්ධයෙන් පර්යේෂණ විල්හැම් ගයිගර්, සෙනරත් පරණවිතාන, ශ්‍රීනාත් ගණේවත්ත, ඩී. එන්. ඩී. වැලිකල, වැනි විද්වතුන් අතින් සිදු විය. එහෙත් ඒ අදහස් එකිනෙකට පරස්පර වන අතර ඇ'වර්ණය යනු කුමක් ද, එහි භාවිතය කෙබඳු ද, රූපයක් ලෙස සිංහල භාෂාවට ම ආවේණික ව පවතින්නේ කෙසේ ද, රූප විකාසය කෙසේ සිදු වී ද යන්න පිළිබඳ විධිමත් පර්යේෂණයක් සිදු වී නොමැත. එබැවින් කලක් මහත් ආන්දෝලනයකට හේතු වූ ඇ'වර්ණය සිංහලයේ පැවති සහ පවතන ස්වභාවය පිළිබඳ ව අධ්‍යයනයක අවශ්‍යතා ව මතු විය. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස, ක්ෂේත්‍ර අධ්‍යයනය, (අනුරාධපුර, අලුත් නුවර, ජාතික කෞතුකාගාරය), සම්මුඛ සාකච්ඡා, දැක්විය හැකි අතර ද්විතීයික මූලාශ්‍රය වන්නේ පුස්තකාල පරිහරණය හා ග්‍රන්ථ පරිශීලනය අධ්‍යයනය යි. වාර සඟරා, පුවත්පත්, අන්තර්ජාලය, හා දේශන සටහන් තෘතීයික මූලාශ්‍රය වේ. ඇ'වර්ණය යනු ක්‍රි. ව. 8 වැනි සිහවසේ මුල් භාගයේ දී සිංහල හෝඩියට ඇතුළත් ව ක්‍රි. ව. 9-12 සියවස්වල අධික ලෙස භාෂාවේ යෙදුණු, ස්වාභාවික පරිණාමයේ ඵලයක් ලෙස සිංහලයේ පවතින ස්වාධීන වර්ණයකි. දඹදෙණි අවදියේ පටන් ක්‍රමයෙන් ඇ'වර්ණයේ බලපෑම සිංහල භාෂාවෙන් ගිලිහී ගිය අතර මහනුවර යුගය වන විට පොලොන්නරු යුගයේ පැවති දැඩි බලපෑම සම්පූර්ණයෙන් ම වියැකී ගොස් තිබේ. නැවතත් 19 වන සියවසේ ශාස්ත්‍ර ප්‍රබෝධයෙන් ඇ'කාරයේ බලපෑම මතු වී පැමිණියත් සිංහල භාෂාවේ පවතින්නට තරම් එය ප්‍රබල නො වූ අතර ඇ'කාරය පිළිබඳ වෙන ම රීති පද්ධතියක් පමණක් ඉතිරි විය. වර්තමානයේ ඇ'වර්ණය ද අනෙකුත් අක්ෂර මෙන් භාෂාවෙහි ස්ව කාර්යය ඉටු කරන ආකාරය දැකගත හැකි අතර අක්ෂර රූපයක් ලෙස අනෙකුත් භාෂාවන් අතර සිංහලයට විශේෂත්වයක් ගෙන දෙන්නේ ද ඇ'වර්ණය යි. ක්‍රි. ව. 8 වැනි සියවසෙන් ආරම්භ වූ එහි රූප විකාසය 16 වැනි සියවස දක්වා වර්ධනය විය. අනතුරු ව ඇ'වර්ණයේ වත්මන් ස්වරූපය දැකගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** ඇ'වර්ණය, සිංහල හෝඩිය, අක්ෂර, රූප විකාසය, මාතෘ භාෂා

[1] සිංහල අධ්‍යයන අංශය